# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,264 - 2022 ජනවාරි මස 21 වැනි සිකුරාදා - 2022.01.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 140 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.* - ගලහ හදවතී ජාතික භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථාන භාරය පනත් කෙටුම්පත 2022 ජනවාරි මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**
**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 පෙබරවාරි මස 11 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 ජනවාරි 28 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

---

139- B 82310— 5,403 (2022/01)

# පළාත් පාලන නිවේදන

## නුවරඑළිය මහා නගර සභාව

### ගෝඝාතක ආඥාපනත

ගෝඝාතක ආඥාපනතේ 272 වැනි අධිකාරියේ 17(1) දරන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව නුවරඑළිය මහා නගර සභාවේ නගරාධිපති දේශමාන්‍ය පී. ඩී. චන්දන ලාල් කරුණාරත්න වන මා විසින් 2022 වර්ෂය තුළ මෙහි පහත ලේඛනයට අනුව එහි සඳහන් දිනයන්හි දී සහ රජය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන දිනයන් හා මා විසින් විටින් විට නිකුත් කරනු ලබන නියෝග අනුව නුවරඑළිය මහා නගර සභා බල ප්‍රදේශය තුළ මස් පිණිස සතුන් මැරීම/මස් විකිණීම/මස් විකිණීම පිණිස ප්‍රදර්ශනය කොට තැබීම හා මස් වර්ග විකුණනු ලබන ස්ථාන විවෘත කොට තැබීම සපුරා තහනම් බව මෙයින් නිවේදනය කරමි.

### උපලේඛනය

| | | | | |
|---|---|---|---|---|
| 2022 | වර්ෂයේ | ජනවාරි | 14 සිකුරාදා | තෛපොංගල් දිනය |
| 2022 | වර්ෂයේ | ජනවාරි | 15 සෙනසුරාදා | තෛපොංගල් දිනයට පසු දිනය |
| 2022 | වර්ෂයේ | ජනවාරි | 17 සඳුදා | දුරුතු පුර පසළොස්වක පෝය දිනය |
| 2022 | වර්ෂයේ | පෙබරවාරි | 04 සිකුරාදා | ජාතික නිදහස් දිනය |
| 2022 | වර්ෂයේ | පෙබරවාරි | 16 බදාදා | නවම් පුර පසළොස්වක පෝය දිනය |
| 2022 | වර්ෂයේ | මාර්තු | 01 අඟහරුවාදා | මහා සිව රාත්‍රී දිනය |
| 2022 | වර්ෂයේ | මාර්තු | 17 බ්‍රහස්පතින්දා | මැදින් පුර පසළොස්වක පෝය දිනය |
| 2022 | වර්ෂයේ | අප්‍රේල් | 15 සිකුරාදා | මහා සිකුරාදා දිනය |
| 2022 | වර්ෂයේ | අප්‍රේල් | 16 සෙනසුරාදා | බක් පුර පසළොස්වක පෝය දිනය |
| 2022 | වර්ෂයේ | මැයි | 01 ඉරිදා | මැයි දිනය |
| 2022 | වර්ෂයේ | මැයි | 15 ඉරිදා | වෙසක් පුර පසළොස්වක පෝය දිනය |
| 2022 | වර්ෂයේ | මැයි | 16 සඳුදා | වෙසක් පුර පසළොස්වක පෝය දිනයට පසු දිනය |
| 2022 | වර්ෂයේ | ජූනි | 14 අඟහරුවාදා | පොසොන් පුර පසළොස්වක පෝය දිනය |
| 2022 | වර්ෂයේ | ජූලි | 13 බදාදා | ඇසළ පුර පසළොස්වක පෝය දිනය |
| 2022 | වර්ෂයේ | අගෝස්තු | 11 බ්‍රහස්පතින්දා | නිකිණි පුර පසළොස්වක පෝය දිනය |
| 2022 | වර්ෂයේ | සැප්තැම්බර් | 10 සෙනසුරාදා | බිනර පුර පසළොස්වක පෝය දිනය |
| 2022 | වර්ෂයේ | ඔක්තෝබර් | 04 අඟහරුවාදා | ලෝක සත්ත්ව දිනය |
| 2022 | වර්ෂයේ | ඔක්තෝබර් | 09 ඉරිදා | වප් පුර පසළොස්වක පෝය දිනය |
| 2022 | වර්ෂයේ | ඔක්තෝබර් | 24 සඳුදා | දීපවාලී උත්සව දිනය |
| 2022 | වර්ෂයේ | නොවැම්බර් | 07 සඳුදා | ඉල් පුර පසළොස්වක පෝය දිනය |
| 2022 | වර්ෂයේ | දෙසැම්බර් | 07 බදාදා | උඳුවප් පුර පසළොස්වක පෝය දිනය |

රජය විසින් ප්‍රකාශයට පත් කරන වෙනත් දිනයන්,

දේශමාන්‍ය පී. ඩී. චන්දන ලාල් කරුණාරත්න,
නගරාධිපති,
නුවරඑළිය මහා නගර සභාව.

නුවරඑළිය මහා නගර සභා කාර්යාලයේ දී ය.

01-165

## කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාව

### ගෝඝාතක ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරාත්මකව දක්වා ඇති ස්ථානයේ ගෝඝාතක ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා 2022 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත්, ඒ අනුව බලපත්‍රය නිකුත් කිරීම සඳහා කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභා සීමාව තුළ පදිංචි යම් අයෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම *ගැසට්* පත්‍රයේ පළ වූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය ඇති බවත්, 270 වන අධිකාරිය *හෙවත්* ගෝඝාතක ආඥාපනතේ 7 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජේ. තිලකරත්න,
සභාපති,
කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාව.

### *උපලේඛනය*

| *අනු. අංකය* | *ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය* | *ගෝ ඝාතකාගාරය පවත්වාගෙන යනු ලබන ස්ථානය* | *බලපත්‍ර වලංගු කාලය* |
|---|---|---|---|
| 01 | බී. එම්. රාකිබ් මයා,<br>දහනක්වැව, මුකිරියාව | දහනක් වැව | 2022.01.01 සිට 2022.12.31 දක්වා |
| 02 | ඩබ්ලිව්. රයිෂානා මයා,<br>කිරි ඉබ්බෑව, කහටගස්දිගිලිය | පාන්බට්ටියාගම, කිරි ඉබ්බෑව | 2022.01.01 සිට 2022.12.31 දක්වා |
| 03 | එම්. එම්. කාසිම් මයා,<br>මුස්ලිම් දිවුල්වැව, කහටගස්දිගිලිය | මුස්ලිම් දිවුල්වැව, කහටගස්දිගිලිය | 2022.01.01 සිට 2022.12.31 දක්වා |
| 04 | ප්‍රාදේශීය සභා ගෝඝාතකාගාරය | හැට්ටුවැව | 2022.01.01 සිට 2022.12.31 දක්වා |
| 05 | ටී. එම්. රිපාස් මයා,<br>දහනක්වැව, මුකිරියාව | දහනක්වැව,<br>මුකිරියාව | 2022.01.01 සිට 2022.12.31 දක්වා |

01-191

---

## මහනුවර මහා නගර සභාව

### ගෝඝාතක ආඥාපනත

ගෝඝාතක ආඥාපනතේ (272 වැනි අධිකාරය) අංක 17(1) දරන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව නියමිත අධිකාරී තැන වූ මහනුවර පුරපති කේසර ඩී. සේනානායක වන මා විසින් 2022 වර්ෂය තුළ මහනුවර මහා නගර සීමාව තුළ මෙහි පහත පළමුවැනි උපලේඛනයෙහි හා දෙවැනි උපලේඛනයෙහි සඳහන් දිනයන්හි දී ද, විශේෂ හේතූන් මත රජය විසින් හා මා විසින් නියෝග කරනු ලබන වෙනත් දිනයන් හි දී ද, මස් පිණිස සතුන් මැරීම, මස් විකිණීම, මස් විකිණීම පිණිස ප්‍රදර්ශනය කොට තැබීම හා මස් වර්ග විකුණනු ලබන ස්ථාන විවෘත කොට තැබීම සම්පූර්ණයෙන් තහනම් කරනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

කේසර ඩී. සේනානායක,
නගරාධිපති,
මහනුවර මහා නගර සභාව.

2022 ජනවාරි මස 10 වැනි දින,
මහා නගර සභාව,
මහනුවර.

**පළමුවැනි උපලේඛනය**

| | | |
|---|---|---|
| ජනවාරි | 17 සඳුදා | දුරුතු පුර පසළොස්වක පෝය දිනය |
| පෙබරවාරි | 16 බදාදා | නවම් පුර පසළොස්වක පෝය දිනය |
| මාර්තු | 17 බ්‍රහස්පතින්දා | මැදින් පුර පසළොස්වක පෝය දිනය |
| අප්‍රේල් | 16 සෙනසුරාදා | බක් පුර පසළොස්වක පෝය දිනය |
| මැයි | 15 ඉරිදා | වෙසක් පුර පසළොස්වක පෝය දිනය |
| මැයි | 16 සඳුදා | වෙසක් පුර පසළොස්වක පෝය දිනයට පසු දිනය |
| ජූනි | 14 අඟහරුවාදා | පොසොන් පුර පසළොස්වක පෝය දිනය |
| ජූලි | 13 බදාදා | ඇසළ පුර පසළොස්වක පෝය දිනය |
| අගෝස්තු | 11 බ්‍රහස්පතින්දා | නිකිණි පුර පසළොස්වක පෝය දිනය |
| සැප්තැම්බර් | 10 සෙනසුරාදා | බිනර පුර පසළොස්වක පෝය දිනය |
| ඔක්තෝබර් | 09 ඉරිදා | වප් පුර පසළොස්වක පෝය දිනය |
| නොවැම්බර් | 07 සඳුදා | ඉල් පුර පසළොස්වක පෝය දිනය |
| දෙසැම්බර් | 07 බදාදා | උඳුවප් පුර පසළොස්වක පෝය දිනය |

**දෙවැනි උපලේඛනය**

වර්ෂය තුළ සෑම මසකම ඉරිදා සහ පහත සඳහන් ප්‍රසිද්ධ නිවාඩු දිනයන්වලදී හා මීට අමතරව විශේෂ හේතුවක් මත රජය විසින් හා මා විසින් නියෝග කරනු ලබන වෙනත් දිනයන්වලදී :

| | | |
|---|---|---|
| ජනවාරි | 14 සිකුරාදා | දෙමළ තෛපොංගල් දිනය |
| පෙබරවාරි | 04 සිකුරාදා | ජාතික නිදහස් දිනය |
| මාර්තු | 01 අඟහරුවාදා | මහා සිව රාත්‍රී දිනය |
| අප්‍රේල් | 13 බදද | සිංහල හා දෙමළ අලුත් අවුරුදු දිනයට පෙර දිනය |
| අප්‍රේල් | 14 බ්‍රහස්පතින්ද | සිංහල හා දෙමළ අලුත් අවුරුදු දිනය |
| අප්‍රේල් | 15 සිකුරාදා | මහා සිකුරාදා දිනය |
| මැයි | 01 ඉරිදා | ලෝක කම්කරු දිනය |
| මැයි | 03 අඟහරුවාද | ඊදුල් ෆිතර් (රාමසාන් දිනය) |
| ජූලි | 10 ඉරිද | ඊදුල් - අල්හා (හජ්ජි උත්සව දිනය) |
| ඔක්තෝබර් | 04 අඟහරුවාදා | ලෝක සත්ව දිනය |
| ඔක්තෝබර් | 09 ඉරිද | (මීලාද්-දුන්-නබි) නබි නායකතුමාගේ උපන් දිනය |
| ඔක්තෝබර් | 24 සඳුදා | දීපවාලී උත්සව දිනය |
| දෙසැම්බර් | 25 ඉරිද | නත්තල් උත්සව දිනය |

01-215

## උඩුනුවර ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(01) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(01) වැනි වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම්වල හිමිකරුවන් ලෙස අයත් ඉඩම් හිමිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශවයන් හෝ යම් විරෝධතාවයක් පළ කරන්නේ නම්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දිනයේ සිට එක් මාසයක් ඇතුළත තමන්ගේ අයිතිය නිවේදනය කිරීම ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(02) වැනි වගන්තිය ප්‍රකාරව ක්‍රියාකරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ. එසේ එවන ලිපි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

02. මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳ යම් විරෝධතාවයක් නොවුණහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ටී. එම්. ගාමිණී තෙන්නකෝන්,
සභාපති,
උඩුනුවර ප්‍රාදේශීය සභාව,
ගෙලිඔය.

### ලියාපදිංචි කළ යුතු මාර්ග


| *අනු. අංකය* | *ග්‍රාමනිලධාරී වසම* | *මාර්ගයේ නම* | *ආරම්භය* | *අවසානය* | *වම්පස පදිංචිකරුවන්* | *දකුණුපස පදිංචිකරුවන්* | *දිග* | *පළල* |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | අංක 43 පිටවලවත්ත | කොස්වැටිය නව ඇල්පිටිය මාර්ගය | දුම්රිය මාර්ගයට සමාන්තර මාර්ග යේ සිට | නිව් ඇල්පිටිය | ඩබ්. එම්. ඩී. සී. බී. විජේතුංග<br>ඩබ්. එම්.සී.බී. විජේතුංග<br>වජිරා ජයංගනී අලහකෝන්<br>ඩබ්. එම්. ඩබ්. කේ. එම්. විජේතුංග<br>එම්. එම්. සමරකෝන් බංඩා<br>එස්. එම්. එන්. සූරියපක්ෂ<br>ටී ජී. තිලකරත්න | ජී. එම්.එන්. ජී. ගුණරත්න<br>එච්. එම්. ඒ. ආර්. හිටිබණ්ඩා<br>පී. ඩබ්. මනෝරි මංජරිකා පහලවිතාන<br>සරත් විජේසිංහ<br>ඩබ්. එම්. එම්. සී. බී. විජේතුංග<br>කේ. ඩබ්. අයි. ජී. කේ. හේරත් | මීටර් 310 | අඩි 09 |
| 02. | අංක 58 බූවැලිකඩ | පල්ලේතැන්න වත්ත *නොහොත්* පුනහල්ලහේන ගමසභා පාර | මස්ජිදුල් රහ්මාන් පල්ලිය පාර සිට | පුනහල්ලහේන වත්ත | එස්. රහුමා බිබී<br>එම්. අයි. සුබයිදා උම්මා<br>එම්. අයි. එම්. ලාෆීර් | අයි. එම්. මුසම්මිල්<br>එස්. එම්. එම්. අරූස්<br>එස්. එම්. අස්ලිම් සජ්<br>ඒ. එල්. සේගු මොහම්මඩ් | අඩි 180 | අඩි 07 |

මිනින්දෝරු සැලැස්ම සහිත

| අනු. අංකය | ග්‍රාම නිලධාරී වසම | මාර්ගයේ නම | ආරම්භය | අවසානය | වම්පස පදිංචිකරුවන් | දකුණුපස පදිංචිකරුවන් | දිග | පළල |
|---|---|---|---|---|---|---|---|---|
| 03. | අංක 98 දූල්දෙණිය | අස්වැද්දුමේ සිට කේ. එම්. රණතුංග මයාගේ නිවස දක්වා මාර්ගය | අස්වැද්දුම | කේ. එම්. රණතුංග මයාගේ නිවස | ජී. ජී. සඳමාලි ගල්ලන්ගොඩ<br>කේ. එම්. ජයවීර<br>කේ. එම්. එන්. සී. බී. කුලතුංග | කේ. එම්. රුවන් චන්දන කුලතුංග<br>ජී. ආර්. ජයන්ත කුලකුමාර<br>කේ. එම්. කරුණාවතී කුලතුංග<br>කේ. එම්. නර්මදා කුලතුංග | මීටර් 200 | අඩි 10 |
| 04. | අංක 16 අලපලාවල නැගෙනහිර | තොටදෙනිය සිට කිතුල්දෙණිය වත්ත පාර | තොටදෙනිය | පේරගොල්ල වත්ත මායිම | මුරුගේසු පත්මනාදගේ,<br>ඒ. ජී. ශාන්ත කුමාර ගුණරත්න<br>බී. එම්. එස්. බී. එම්. බස්නායක<br>ගලගෙදර ධම්මාලංකාර හිමි<br>දමයන්ති මහලේකම්<br>ඒ. ජී. කරුණාරත්න<br>ආර්. රණසිංහ<br>සුභද්‍රා රත්නායක<br>කේ. ඒ. ඩී. දයාරත්න කුමාරපේලි | ඒ. ජී. කරුණාරත්න<br>සුභද්‍රා රත්නායත<br>ගලගෙදර ධම්මාලංකාර හිමි<br>ඉයේෂා කුමුදුමාලි රණසිංහ<br>අසංක ගයාන් රණසිංහ ආරච්චි<br>බී. එන්. ජයසූරිය | මීටර් 240 | අඩි 13 |

M.S.B. Ankumbura
Registered Licensed Surveyor
(SLSC Regrd. No. 20172148)
No:30, Unambuwa
Gampola

PLAN No : 13




Reference
BW - Boundary Wall
RW - Retaning Wall
NF - Net Fence
LF - Live Fence
B - Bank
CUL - Culvert
CP - Cement Post
TP - Telephone Post
EP - Electric Post
Road(RDA) - Road (Road Development Authority)

Scale 1:1000
PLAN OF
land called
"KITULDENIYA ESTATE (Part)"
Being parts of Estate road shown in Plan 2637 & 2771,
Prepared by LS P.M.G. Munasinghe
Situated at Alapalawala (previously Kithuldeniya)
Alapalawala East Grama niladhari division in Gangapalata Korale,
of Udunuwara
KANDY DISTRICT - CENTRAL PROVINCE

| Section | Width (m) |
|---|---|
| "A" | 4.9 |
| "B" | 4.75 |
| "C" | 5.66 |
| "D" | 3.6 |
| "E" | 5.15 |
| "F" | 3.44 |

Note
—Total length along the center of the road nearly 250 m .
—Boundaries point out by Mr. I.K. Ranasinghe, Mr. Sivakumar & Others.


CPC/UNPS/3/4/1/116

Surveyed on 28th of February 2021

M.S.B. ANKUMBURA
REGISTERD LICENSED SURVEYOR
30,UNAMBUWA,GAMPOLA
REG:NO. 20172148

පී.කේ.ඩබ්.කරුණාරත්න
මියාපදිංචි බලයලත් මිනින්දෝරු සහ
උසාවිකොමසාරිස්
අංක : 190/7, කිරින්දවත්ත, ගල්ගෙඩියාව,
ගම්පොල
දුර : 081-2352973

පිඹුරු අංකය :- 3373




පරිමාණය :- 1:1000

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක (98) දැල්දෙණිය ග්‍රාමනිළධාරී කොට්ඨාශයේ ගාල්කොහෝ ගමේ පිහිටි " අස්වැද්දුම හන්දිය සිට කේ.එම්.රණතුංගගේ නිවස දක්වා දිවෙන මාර්ගය"

| කැබලි අංකය | බිම් ප්‍රමාණය | | | | ඉඩම් පරිහරණය | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|
| | හෙක් | අක් | රූඩ් | පර් | | |
| 1 | 0.0565 | 0 | 0 | 22.35 | මාර්ගය | දිග ප්‍රමාණය මීටර 155 යි |
| එකතුව | 0.0565 | 0 | 0 | 22.35 | --- | ----- |

දැල්/ගාල්/ම/4/1/164
ඉහත පිටපත හා සැසඳෙන බවට සනාථ කරමි
.......
ප්‍රධාන කළමනාකරණ සහකාර
උඩුනුවර ප්‍රාදේශීය සභාව

මැනීම කළේ :- 2021 ඔක්තෝබර් මස 16 වන දිනයේදී

Karunarathna
පී.කේ.ඩබ්. කරුණාරත්න
බලයලත් මිනින්දෝරු,
කළමනාකරු හා උසාවි කොමසාරිස්
අංක 29,19/1,ගම්පොල
ශ්‍රී.ලං.ග.ම. බිස්නැවතුම්පොළ,ගම්පොල
2021. 11. 04

මායිම් විස්තර ඉහත සඳහන් පරිදි වේ

01-164